**රජයේ දැන්වීමයි**

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2016

ප්‍රතිඵල නැවත සමීක්ෂණය

උක්ත විභාගයේ ප්‍රතිඵල විදුහල්පතිවරුන් හා පෞද්ගලික අයදුම්කරුවන් වෙත දැනටමත් තැපැල් කර යවා ඇත.

මෙම විභාගයේ ප්‍රතිඵල නැවත සමීක්ෂණය කිරීම සඳහා අයදුම්කරුවන් විසින් මේ සමඟ ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රය අනුව පිළියෙල කරන ලද සෙ.මී. 30 x සෙ.මී. 20 ප්‍රමාණයේ ඉල්ලුම් පත්‍ර **2017.01.23** දින හෝ ඊට පෙර ලැබෙන සේ **විභාග කොමසාරිස් ජනරාල්, ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත්‍ර බහා එවන කවරයේ ඉහළ, වම් කෙළවරෙහි **''ප්‍රතිඵල නැවත සමීක්ෂණය - අ.පො.ස. (උ.පෙළ) විභාගය 2016''** යන්න සඳහන් කළ යුතු ය.

ප්‍රතිඵල නැවත සමීක්ෂණයේදී අදාළ පිළිතුරු පත්‍ර සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයින් කිහිප දෙනෙක් යටතේ සම්පූර්ණයෙන් ම පරීක්ෂාවට ලක් කරනු ලැබේ. නැවත සමීක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස z ලකුණෙහි හෝ ලැබී ඇති ශ්‍රේණියේ වැඩිවීමක් හෝ අඩුවීමක් හෝ සිදුවිය හැකි බව අපේක්ෂකයින් විසින් දැනගත යුතු බව අවධාරණය කරමි.

**ඉල්ලුම් පත් පිළියෙල කිරීමේදී පහත සඳහන් උපදෙස් අනුගමනය කළ යුතු ය.**

01. පාසල් අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර අදාළ විදුහල්පති මගින් ද, පෞද්ගලික අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර තමා විසින්ම ද ඉහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.
02. ඉල්ලුම් පත්‍ර, ආදර්ශ ආකෘතිය අනුව ම පිළියෙල කළ යුතු ය.
03. එක් විෂයයක් සඳහා නැවත සමීක්ෂණය කිරීමේ ගාස්තුව රු. 250/= කි. තැපැල් කාර්යාලයකට හෝ උප තැපැල් කාර්යාලයකට නියමිත ගාස්තුව ගෙවා කුවිතාන්සියක් ලබා ගෙන එය ඉල්ලුම්පත්‍රයෙහි **පසු පිටෙහි නොගැළවෙන සේ හොඳින් අලවා එවිය යුතු ය.** මුදල් ගෙවා ලබා ගත් කුවිතාන්සියේ අංකය ද, ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද අයදුම්කරු ළඟ තබා ගත යුතු ය. (හැකිනම් මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම වඩාත් යෝග්‍ය වේ.)
04. මුද්දර, චෙක්පත්, මුදල් ඇණවුම් හෝ තැපැල් ඇණවුම් භාර ගනු නොලැබේ.
05. එක් විෂයයකට එක් ඉල්ලුම් පත්‍රය බැගින් වෙන වෙනම ඉදිරිපත් කළ යුතු ය.
06. ප්‍රතිඵල ලේඛනයේ දක්වා ඇති පරිදි විභාග අංකය, විභාගයට පෙනී සිටි මධ්‍යස්ථානයේ නම, විෂය අංකය හා විෂයය, ලැබූ ශ්‍රේණිය සහ මාධ්‍යය නිවැරදිව ලිවිය යුතු ය. උපදෙස් හොඳින් කියවා ඉල්ලුම් පත්‍රය නිවැරදිව සම්පූර්ණ කිරීම ඉල්ලුම්කරුගේ වගකීම වේ. **විශේෂයෙන් 01 (i) හි විෂය අංකය හා විෂයය ගැළපීම නිවැරදි විය යුතු ය.**
07. අසම්පූර්ණ ඉල්ලුම් පත්‍ර, 2017.01.23 දිනට පසුව එවන ඉල්ලුම් පත්‍ර හා අදාළ ගාස්තුව ගෙවා නොමැති ඉල්ලුම් පත්‍ර කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, එවැනි ඉල්ලුම් පත්‍ර සඳහා ගෙවා ඇති ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.
08. පෞද්ගලික අයදුම්කරුවන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයෙහි ඇතුළත් 01 සිට 07 දක්වා තොරතුරු පමණක් සම්පූර්ණ කිරීම ප්‍රමාණවත් වේ.
09. **විෂය අංක 12 - සාමාන්‍ය පොදු පරීක්ෂණය සඳහා ලකුණු 30 කට වඩා අඩු වීම හේතුවෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලැබූ අයදුම්කරුවන්ට එම විෂයය සඳහා ද නැවත සමීක්ෂණ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.**
10. මෙම දැන්වීම සහ ආදර්ශ ඉල්ලුම් පත්‍රය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ ද (www.doenets.lk) පළ කර ඇත.

**සැ.යු. වැරදි තොරතුරු ඇතුළත් නැවත සමීක්ෂණ ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

ඇගයීම් (පාසල් විභාග) ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 1503, කොළඹ.
2017.01.07